# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2382/04 - 2024 අප්‍රේල් මස 30 වැනි අඟහරුවාදා - 2024.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වැනි වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් පනවනු ලැබ, 2024 අප්‍රේල් මස 25 වැනි දින අංක 2381/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලය ප්‍රකාරව කම්කරු කොමසාරිස් ජනරාල් එච්. කේ. කේ. ඒ. ජයසුන්දර වන මම තේ වැවීමේ සහ සැදීමේ කර්මාන්තයෙහි නියුක්ත සේවකයන් සම්බන්ධයෙන්, පහත උපලේඛනයෙහි සඳහන් දෛනික අවම ගෙවීම් ප්‍රමාණය එම ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දැක්වෙන විරෝධතාවයන් 2024 මැයි මස 15 දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියෙස'',
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

1A - G 41849— 09 (2024/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1945 ජූලි මස 31 වැනි දින අංක 9441 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, වරින් වර වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2021 මාර්තු 05 දින අංක 2217/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ එකී II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

*II කොටස*

**තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තයේ සේවයේ නියුතු කම්කරුවන් සඳහා ගෙවීම් කිරීමේ ක්‍රමවේදය**

| *අනු. අංකය* | *විස්තරය* | *ගෙවීම* |
|---|---|---|
| I. | දෛනික වේතනය<br>(මෙම ප්‍රමාණය තුළ දෛනික අයවැය සහන දීමනාව ද ඇතුළත් වන අතර සේ. අ. අ. සහ සේ. නි. භා. අ. ගෙවීම සඳහා මෙම ප්‍රමාණය අදාළ කරගත යුතු වේ.) | රු. 1,350.00 |
| II. | දෛනික විශේෂ දීමනාව | රු. 350.00 |
| III. | දෛනික සම්පූර්ණ ගෙවීම | රු. 1,700.00 |
| IV. | වැඩිපුර ගෙනෙන කිලෝග්‍රෑම් 01 ක් සඳහා ගෙවීම | රු. 80.00 |

EOG 04 - 0241/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වැනි වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් පනවනු ලැබ, 2024 අප්‍රේල් මස 25 වැනි දින අංක 2381/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලය ප්‍රකාරව කම්කරු කොමසාරිස් ජනරාල් එච්. කේ. කේ. ඒ. ජයසුන්දර වන මම රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තයෙහි නියුක්ත සේවකයන් සම්බන්ධයෙන්, පහත උපලේඛනයෙහි සඳහන් දෛනික අවම ගෙවීම් ප්‍රමාණය එම ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දැක්වෙන විරෝධතාවයන් 2024 මැයි මස 15 දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියෙස'',
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1949 නොවැම්බර් මස 25 වැනි දින අංක 10047 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, වරින් වර වෙනස්

කරන ලද්දාවූ ද, අවසන් වරට 2021 මාර්තු 05 දින අංක 2217/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ එකී II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

*II කොටස*

**රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තයේ සේවයේ නියුතු කම්කරුවන් සඳහා ගෙවීම් කිරීමේ ක්‍රමවේදය**

| *අනු. අංකය* | *විස්තරය* | *ගෙවීම* |
|---|---|---|
| I. | දෛනික වේතනය<br>(මෙම ප්‍රමාණය තුළ දෛනික අයවැය සහන දීමනාව ද ඇතුළත් වන අතර සේ. අ. අ. සහ සේ. නි. භා. අ. ගෙවීම සඳහා මෙම ප්‍රමාණය අදාළ කරගත යුතු වේ.) | රු. 1,350.00 |
| II. | දෛනික විශේෂ දීමනාව | රු. 350.00 |
| III. | දෛනික සම්පූර්ණ ගෙවීම | රු. 1,700.00 |
| IV. | වැඩිපුර ගෙනෙන කිලෝග්‍රෑම් 01 ක් සඳහා ගෙවීම | රු. 80.00 |

EOG 04 - 0241/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.